# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2269/58 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : බී/ඉ/3/මාර්ග සං-5/අත්පත්.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/7/2018/HW/463.

පේරාදෙණිය - බදුල්ල - චෙන්කලඩි මාර්ගය පුළුල් කිරීම සඳහා අතිරේක ඉඩම් අත්පත් කරගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :*

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බිබිල පිහිටි මොණරාගල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කර ඇති අවසාන ගම් සිතියම් පිඹුරේ 573 අතිරේක අංක 104 පත්‍ර අංක 105 හි දැක්වෙන ඉඩම් කැබලි :

ඉඩමේ මුළු ප්‍රමාණය හෙක්ටයාර් : 0.0093

01. **කැබලි අංක 1526**
ඉඩමේ නම : බුරුතකැටිය වත්ත; හිමිකම් කියන අය: පෞද්ගලික ඩී. එම්. ගුණරත්න භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0073.

02. **කැබලි අංක 1527**
ඉඩමේ නම : බුරුතකැටිය වත්ත; හිමිකම් කියන අය: පෞද්ගලික ඩී. එම්. අමරා දමයන්ති මැණිකේ වීරසේකර භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0015.

03. **කැබලි අංක 1528**
ඉඩමේ නම : බුරුතකැටිය වත්ත; හිමිකම් කියන අය: පෞද්ගලික කේ. ආර්. සියනෝරිස් ප්‍රනාන්දු භුක්ති විඳියි; ප්‍රමාණය: හෙක්. 0.0005.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2022 අප්‍රේල් මස 25 වැනි දින පෙරවරු 9.30 ට බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2022 මාර්තු මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

උපේක්ෂා එන්. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
බිබිල.

2022 පෙබරවාරි මස 28 වැනි දින,
බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 3-0734